[redacted]

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 25A - ඉන්දීය ඉතිහාසය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

## 25A - ඉන්දීය ඉතිහාසය

## ලකුණු බෙදී යාමේ ආකාරය

**I පත්‍රය** = 01 x 40 = 40

**II පත්‍රය**

| | | |
|---|---|---|
| **අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු** | = | 12 |
| **සෙසු ප්‍රශ්න 03 කට 16 බැගින්** | = | 48 |
| II **පත්‍රය අවසාන ලකුණු** | = | 60 |

**අවසාන ලකුණු = 40 + 60 = 100**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ඉන්දිය ඉතිහාසය II (I කොටස)
இந்திய வரலாறு II (பகுதி I)
History of India II (Part I)

**25 A S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**ඉන්දිය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

විභාග අංකය: ..................................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
* **I කොටසෙහි 1- 40** දක්වා ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
* **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
* කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) සුප්පාරක (2) භාරුකච්ඡ (3) පාටලීපුත්‍ර (4) තාම්‍රලිප්ති (5) කල්යාන් - (......)

**2.** (1) මහානදී (2) ගෝදාවරී (3) කෘෂ්ණා (4) තුංගභද්‍රා (5) කතියවාර් - (......)

**3.** (1) මෞර්ය (2) සූරසේන (3) අවන්ති (4) අංග (5) පංචාල - (......)

**4.** (1) නිගණ්ඨනාථපුත්‍ර (2) පූර්ණ කස්සප (3) නාගර්ජුන (4) අජිත කේශකම්බල (5) මක්ඛලි ගෝසාල (......)

**5.** (1) තිරුවාලංගාඩු (2) තිරුමලෙයි (3) උත්තරමේරූර් (4) ආර්පාක්කම් (5) පෙරුන්දරම් - (......)

**6.** (1) මහේන්ද්‍ර (2) පුෂ්‍යමිත්‍ර සුංග (3) ව්‍යාඝ්‍රරාජ (4) උග්‍රසේන (5) විෂ්ණුගෝප - (......)

**7.** (1) කාලිදාස (2) ආර්යභට (3) විශාකදත්ත (4) බාණභට්ට (5) අමරසිංහ - (......)

**8.** (1) මහබලිපුරම් (2) තානේෂ්වර් (3) කාංචිපුරම් (4) තංජෝර් (5) මදුරෙයි - (......)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

9. (1) වත්සරාජ (2) ධ්‍රැව (3) නාගභට
(4) ධර්මපාල (5) දන්තිදුර්ග (......)

10. (1) විජයාලය (2) පළමුවන වික්‍රමාදිත්‍ය (3) පළමුවන පරන්තක
(4) පළමුවන රාජරාජ (5) පළමුවන රාජේන්ද්‍ර (......)

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක යුගලයක** පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) ගංගා - කනෞජ්
(2) නර්මදා - භාරුකච්ඡ
(3) තප්ති - සුප්පාරක
(4) යමුනා - මථුරා
(5) රාවී - හරප්පා (......)

12. (1) අයිහොල්ලේ - පුලකේෂින්
(2) ජුනාගාර්ඩ් - රුද්‍රදාමන්
(3) භිටරි - ස්කන්ධගුප්ත
(4) නාසික් - ගෞතමීපුත්‍ර සාතකර්ණි
(5) හතිගුම්පා - ඛාරවේල (......)

13. (1) අංග - චම්පා
(2) කාසි - බාරානසී
(3) වජ්ජි - වෛශාලි
(4) ගන්ධාර - තක්ෂිලා
(5) කුරු - පංචාල (......)

14. (1) අමිත්‍රඝාත - බින්දුසාර
(2) පරමේෂ්වර - ස්කන්ධගුප්ත
(3) වාතාපිකොණ්ඩ - පළමුවන නරසිංහවර්මන්
(4) මහාරාජාධිරාජ - ප්‍රභාකරවර්ධන
(5) මදුරෙයිකොණ්ඩ - පළමුවන පරන්තක (......)

15. (1) රාෂ්ට්‍රකූට - උජ්ජේනි
(2) චෝළ - තංජෝර්
(3) පාණ්ඩ්‍ය - මදුරෙයි
(4) පල්ලව - කාංචි
(5) සුංග - පාඨලිපුත්‍ර (......)

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරය **X** තීරය සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

| | X | Y |
|---|---|---|
| 16. | (i) අල්බිරූනි | A - අරාබි |
| | (ii) ෆාහියන් | B - ග්‍රීක |
| | (iii) ප්ලිනි | C - චීන |
| | (iv) ස්ට්‍රාබෝ | D - රෝම |
| | (v) තාරනාත් | E - ටිබෙට් |

(1) ACDBE (2) ADCEB (3) BACED (4) BDCAE (5) CABED (......)


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

| | X | | Y |
|---|---|---|---|
| **17.** | (i) දණ්ඩින් | | A - දෙවන චන්ද්‍රගුප්ත |
| | (ii) හරිසේන | | B - සමුද්‍රගුප්ත |
| | (iii) කාලිදාස | | C - කණිෂ්ක |
| | (iv) නාගර්ජුන | | D - දෙවන නරසිංහවර්මන් |
| | (v) පතංජලි | | E - පුෂ්‍යමිත්‍ර සුංග |

(1) BADCE (2) BCAED (3) CBAED (4) DBACE (5) ECABD (......)

| | X | | Y |
|---|---|---|---|
| **18.** | (i) සේනාපති | | A - අන්තඃපුර ප්‍රධානියා |
| | (ii) අන්තර්වසික | | B - දොරටුපාල |
| | (iii) සන්නිධර | | C - හමුදාපති |
| | (iv) දව්වාරික | | D - භාණ්ඩාගාර ප්‍රධානියා |
| | (v) මන්ත්‍රී | | E - ඇමති |

(1) ABEDC (2) ADEBC (3) BACED (4) BADCE (5) CADBE (......)

| | X | | Y |
|---|---|---|---|
| **19.** | (i) කඩුන්ගෝන් | | A - පල්ලව |
| | (ii) පළමුවන නාගභට | | B - රාෂ්ට්‍රකූට |
| | (iii) සිංහවිෂ්ණු | | C - චෝළ |
| | (iv) දන්තිදුර්ග | | D - ප්‍රතිහාර |
| | (v) විජයාල | | E - පාණ්ඩ්‍ය |

(1) ABEDC (2) ADEBC (3) BACED (4) EDABC (5) EDCBA (......)

| | X | | Y |
|---|---|---|---|
| **20.** | (i) අග්නි | | A - පෘථිවියට අධිපති දෙවියා |
| | (ii) ඉන්ද්‍ර | | B - යුද්ධයට අධිපති දෙවියා |
| | (iii) පෘථිවි | | C - ගින්නට අධිපති දෙවියා |
| | (iv) පශුපති | | D - අහසට අධිපති දෙවියා |
| | (v) වරුණ | | E - සතුන්ට අධිපති දෙවියා |

(1) ACDBE (2) BDCAE (3) CBAED (4) DACEB (5) EDCAB (......)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. අශෝක සෙල්ලිපි**

(1) අභිලේඛන රචනා කිරීම ලොවට පළමුවෙන් ම හඳුන්වා දෙනු ලැබුවේ අසෝක රජතුමා විසිනි.
(2) අසෝක රජු තම සෙල්ලිපි මාර්ගයෙන් සෘජුව මහජනතාව ආමන්ත්‍රණය කළේ ය.
(3) අසෝක සෙල්ලිපි බහුතරයක් බ්‍රාහ්මී අක්ෂරවලින් ලියා ඇත.
(4) ශබාෂ්ගරී සහ මන්සේහ්රා සෙල්ලිපි ලියවී ඇත්තේ ඛරෝෂ්ඨී අක්ෂරයෙනි.
(5) අසෝක සෙල්ලිපි ඉන්දියාවෙන් පමණක් නොව වර්තමාන ඇෆ්ඝනිස්ථානය හා නේපාල යන රටවලින් ද හමුවී ඇත. (......)

**22. කනිෂ්ක රජු**

(1) කනිෂ්ක රජු ශක වර්ෂක්‍රමයේ ආරම්භකයා ලෙස සලකනු ලැබේ.
(2) කනිෂ්ක රජුගේ අගනුවර වූයේ පුරුෂපුරයයි.
(3) සමස්ත ඉන්දියාව ම යටත් කර ගැනීමට කනිෂ්ක රජුට හැකි විය.
(4) අශ්වඝෝෂ හිමියන් විසින් කනිෂ්ක රජු බුද්ධාගමට හරවාගන්නා ලදී.
(5) කනිෂ්ක රජු මධ්‍ය ආසියාවට බුද්ධාගම ව්‍යාප්ත කළේ ය. (......)


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**23. ශක පාලකයෝ**

(1) ආරම්භයේ දී ඉන්දු නිම්නයට පැමිණ පදිංචි වූ ශකවරු අනතුරුව වයඹදිග ඉන්දියාවේ තම බලය පිහිටුවා ගත්හ.
(2) මාවුස් ප්‍රථම ශක පාලකයා ලෙස සලකනු ලැබේ.
(3) ශකවරුන්ගේ ආධිපත්‍ය යටතේ පැවති ප්‍රදේශ ක්ෂත්‍රපවලට බෙදා තිබුණි.
(4) සුප්‍රකට ශක පාලකයන් දෙදෙනකු වූයේ මහාරාෂ්ට්‍රය පාලනය කළ නහපාන සහ උජ්ජෙනි පාලනය කළ රුද්‍රදාමන් ය.
(5) ශකවරු පලවාහැර, ඔවුන් සතු ප්‍රදේශ කුෂාණ පාලකයන් විසින් තම රාජ්‍යයට ඈදා ගන්නා ලදී. (……)

**24. දෙවන චන්ද්‍රගුප්ත**

(1) දෙවන චන්ද්‍රගුප්ත වනාහි සමුද්‍රගුප්තගේ පුත්‍රයා ය.
(2) දෙවන චන්ද්‍රගුප්ත තම දියණිය වූ ප්‍රභාවතී කුමරිය වාකාටක දෙවන රුද්‍රසේනට සරණ පාවා දෙනු ලැබී ය.
(3) දෙවන චන්ද්‍රගුප්ත පාලන සමයේ දී පාහියන් නමැති චීන භික්ෂූන් වහන්සේ පාටලීපුත්‍ර නගරයේ කලක් වාසය කළේ ය.
(4) නාලන්දා බෞද්ධ අධ්‍යාපනික මධ්‍යස්ථානය පිහිටුවීමේ ගෞරවය දෙවන චන්ද්‍රගුප්තට හිමි වේ.
(5) දෙවන චන්ද්‍රගුප්ත විසින් බටහිර ඉන්දියානු ප්‍රදේශ ඈදා ගැනීම නිසා ගුප්ත අධිරාජ්‍යයේ දේශසීමා අරාබි මුහුද දක්වා ව්‍යාප්ත විය. (……)

**25. පළමුවන රාජරාජ**

(1) පළමුවන රාජරාජ රජුගේ අවුරුදු තිහක පාලනය චෝළ අධිරාජ්‍යයට පදනම දැමී ය.
(2) පළමුවන රාජරාජ රජුගේ අධිරාජ්‍යයට තුංගභද්‍රා දක්වා මුළු දකුණු ඉන්දියාව, මාලදිවයින් සහ ශ්‍රී ලංකාවේ උතුරු කොටස අයත් විය.
(3) දැඩි ශිව භක්තිකයකු වූ පළමුවන රාජරාජ සෙසු ආගම්වලට දැඩි සේ විරුද්ධ විය.
(4) පළමුවන රාජරාජ පාලන සමයේ දී තංජෝරයේ බෘහදේශ්වර දේවාලය ඉදිකරන ලදී.
(5) පළමුවන රාජරාජ රජු මුම්මුඩිචෝළදේව යන විරුදයෙන් ගෞරව කරනු ලැබී ය. (……)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ………………………………………… **1** ද
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ………………………………………… **2** ද
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ………………………………………… **3** ද
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ………………………………………… **4** ද
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ………………… **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26. භූගෝලීය සාධක**

(A) උතුරේ ඇති කඳු පන්තිය වැදගත් වන්නේ එය ප්‍රධාන ගංගා දෙකක ප්‍රභවයට මුල් වී ඇති බැවිනි.
(B) ගංගා-යමුනා නිම්න අධිරාජ්‍ය කේන්ද්‍රස්ථානයක් විය.
(C) වයඹ දිග ඉන්දියාවේ ඇති කපොලු අතුරෙන් ඉන්දියාවට ඇතුළුවීමට වඩාත් පහසු කපොල්ල වන්නේ මක්‍රාන් කපොල්ලයි.
(D) ආරවල්ලි කඳු උතුරු සහ දකුණු ඉන්දියානු දේශ සීමාව විය. (……)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

27. බිම්බිසාර රජු
(A) බුදුරජාණන් වහන්සේ ජීවත් වූ අවධියේ දී මගධය පාලනය කළේ බිම්බිසාර රජු ය.
(B) බිම්බිසාර රජුගේ අගනුවර පාටලීපුත්‍රය විය.
(C) බිම්බිසාර රජු විවාහ සම්බන්ධතා සහ යුද්මය ක්‍රියාමාර්ග මගින් තම බලය ව්‍යාප්ත කළේ ය.
(D) කාසි ජනපදයේ අයිතිය උදෙසා පසේනදී සහ බිම්බිසාර රජවරු අතර යුද්ධයක් සිදු විය. (......)

28. සාතවාහන රාජවංශය
(A) පුරාණ ග්‍රන්ථවල සාතවාහනයන් හඳුන්වනු ලබන්නේ ආන්ද්‍රයන් යනුවෙනි.
(B) මෙම රාජ වංශයේ ආරම්භකයා ලෙස සැලකෙනුයේ සිමුක ය.
(C) මෙම රාජවංශයට අයත් ප්‍රබල පාලකයන් වන්නේ ගෞතමීපුත්‍ර සාතකර්ණි, වශිෂ්ඨපුත්‍ර ශ්‍රී පුලමාවි සහ යජ්ඥ ශ්‍රී සාතකර්ණි ය.
(D) සාතවාහනයන් යටතේ බ්‍රාහ්මණ ආගම සහ බුද්ධාගම සමෘද්ධිමත්ව පැවතුණි. (......)

29. හියුං සාං
(A) හියුං සාං යනු හර්ෂවර්ධන රාජ සමයේ දී ඉන්දියාවට පැමිණි චීන ජාතික බෞද්ධ භික්ෂුවකි.
(B) හියුං සාං කනෞජයේ පැවති බෞද්ධ සම්මේලනයට සහ ප්‍රයාගයේ පැවති මහා දානමය පිංකමට සහභාගි වී ඇත.
(C) හියුං සාං පළමුව ගන්ධාරයට පැමිණ එතැනින් පාටලීපුත්‍රයට ගියේ ය.
(D) හියුං සාංට තක්ෂිලා බෞද්ධ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබීමට අවස්ථාවක් හිමි විය. (......)

30. ධර්මපාල රජු
(A) සේනවරු පළවාහැර බෙංගාලයේ පාල රාජධානිය පිහිටුවන ලද්දේ ධර්මපාල විසිනි.
(B) වික්‍රමශීලා විශ්වවිද්‍යාලය පිහිටුවීමේ ගෞරවය හිමිවන්නේ ධර්මපාල රජුට ය.
(C) ඉන්ද්‍රායුද පළවාහැර කනෞජයේ සිංහාසනයට චක්‍රායුධ පත්කරන ලද්දේ ධර්මපාල රජු විසිනි.
(D) ධර්මපාල රජු විසින් කනෞජ සිහසුන අල්ලා ගැනීමට උත්සාහ කළ නාගභට පරජය කරන ලදී. (......)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

31. මහා නාන තටාකයේ නටබුන් හමුවන්නේ ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ කුමන නගරයේ ද?
(1) හරප්පා (2) මොහෙන්ජොදාරෝ (3) චන්හුදාරෝ
(4) කලිබංගන් (5) ලෝතාල් (......)

32. මහා ඇලෙක්සැන්ඩර්ගේ සමකාලීන නන්ද පාලකයා කවරෙක් ද?
(1) මහාපද්ම නන්ද (2) පණ්ඩුක (3) භූතපාල
(4) ධනනන්ද (5) රාෂ්ට්‍රපාල (......)

33. සුදර්ශන ජලාශය කවර පාලකයකුගේ කාලයෙහි ඉදිකරන ලද්දේ ද?
(1) චන්ද්‍රගුප්ත මෞර්ය (2) නහපාන (3) රුද්‍රදාමන්
(4) ස්කන්ධගුප්ත (5) හර්ෂවර්ධන (......)

34. රාජතරංගිනි නම් ග්‍රන්ථයේ කර්තෘවරයා කවරෙක් ද?
(1) කාලිදාස (2) විශාකදත්ත (3) බිල්හන
(4) බාණභට්ට (5) කල්හන (......)

35. ක්‍රි.ව. 712 දී ඉන්දියාව ආක්‍රමණය කළ අරාබි පාලකයා කවරෙක් ද?
(1) මහමද් බින් ක්වාසිම් (2) සෂ්ණි මහමුද් (3) අලාඋද්දීන් ඛල්ජි
(4) ඝෝර් මහමුද් (5) කුටුබ්උද්දීන් අයිබෙක් (......)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා, ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | ඍග් වෛදික ජනයා ශාක භක්ෂිකයෝ පමණක් වූහ. | ඍග් වෛදික යුගයේ දී කාන්තාවන්ට යජ්ඤයන්ට සහභාගිවීමට අවසර නොතිබිණි. | (……) |
| **37.** | ගුප්ත අධිරාජ්‍යයේ බටහිර ප්‍රදේශ ආක්‍රමණය කළ හූනයන් ස්කන්ධගුප්ත රජු විසින් පළවා හරින ලදී. | දුර්වල පාලකයන් බිහිවීම නිසා මිහිරකුල හා තෝරාමාන යන හූන පාලකයන් දෙදෙනාට ගුප්ත අධිරාජ්‍යයේ විශාල ප්‍රදේශයක් අල්ලා ගැනීමට හැකි විය. | (……) |
| **38.** | හර්ෂවර්ධන රජු මුළු උතුරු ඉන්දියාවේ ම අධිපති ලෙසට සලකනු ලැබී ය. | නර්මදා නදිය අසල දී කරන ලද සටනක දී චාලුක්‍ය වංශයේ I පුලකේෂින් පරාජය කිරීමට හර්ෂවර්ධන සමත් විය. | (……) |
| **39.** | පල්ලව, ගංග සහ චෝළ සන්ධානය පරාජය කොට ශ්‍රී මාර ශ්‍රී වල්ලභ දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය ආධිපත්‍යය පිහිටුවීමට සමත් විය. | ශ්‍රී මාර ශ්‍රී වල්ලභ ලංකාව ආක්‍රමණය කොට පළමුවන සේන රජු පළවා හැර ලංකාව අල්ලා ගත්තේ ය. | (……) |
| **40.** | තම සතුරු නරසිංහවර්මන් යුද්ධයේ දී මරා දැමීමට චාලුක්‍ය වංශික දෙවන පුලකේෂින් සමත් විය. | තම ජයග්‍රහණය සැමරීමට දෙවන පුලකේෂින් මදුරෙයිහි කෛලාශනාථ දේවාලය ඉදිකරන ලදී. | (……) |

* *


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

### අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

| විෂය අංකය<br>பாட இலக்கம் | 25A | විෂයය<br>பாடம் | ඉන්දීය ඉතිහාසය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 1 | 31. | 2 |
| 02. | 5 | 12. | 4 | 22. | 3 | 32. | 4 |
| 03. | 1 | 13. | 5 | 23. | 5 | 33. | 1 |
| 04. | 3 | 14. | 2 | 24. | 4 | 34. | 5 |
| 05. | 5 | 15. | 1 | 25. | 3 | 35. | 1 |
| 06. | 2 | 16. | 1 | 26. | 1 | 36. | 3 |
| 07. | 4 | 17. | 4 | 27. | 2 | 37. | 2 |
| 08. | 2 | 18. | 5 | 28. | 5 | 38. | ~~3~~ 1 |
| 09. | 5 | 19. | 4 | 29. | 1 | 39. | 1 |
| 10. | 2 | 20. | 3 | 30. | 3 | 40. | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ඉන්දීය ඉතිහාසය II (II කොටස)
இந்திய வரலாறு II (பகுதி II)
History of India II (Part II)

25 A | S | II

**ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

උපදෙස්:

- පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) තක්ෂිලා
(ii) රාවි
(iii) චන්හුදාරෝ
(iv) තානේෂ්වර්
(v) බරණැස
(vi) ගුජරාට්
(vii) තප්ති
(viii) අයිහෝලේ
(ix) හිමාලය කඳුවැටිය
(x) කොරමැන්ඩල් වෙරළ
(xi) සාංචි
(xii) ගංගා

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)

## B කොටස

2. (i) හරප්පා සහ මොහෙන්ජොදාරෝ නටබුන් සොයා ගත් ඉන්දියානු පුරාවිද්‍යාඥයින් **දෙදෙනා** නම් කරන්න. (ලකුණු 02යි.)

(ii) හරප්පා සහ මොහෙන්ජොදාරෝ නගරවල කැණීම් කළ බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාඥයින් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි.)

(iii) (a) මහා ධාන්‍යාගාරයේ නටබුන් හමුවූ නගරය නම් කරන්න. (ලකුණු 01යි.)

(b) ඉන්දු නිම්න වැසියන්ගේ ප්‍රධාන වරාය නම් කරන්න. (ලකුණු 01යි.)

(iv) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නගර නිර්මාණය සහ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 10යි.)

3. ප්‍රාග් වෛදික යුගයේ පැවති දේශපාලන, සමාජ සහ ආගමික තත්ත්වයන් පශ්චාත් වෛදික යුගයේ දී වෙනස් වී ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 16යි.)

4. "අශෝක රජු මෞර්ය අධිරාජ්‍යයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයා විය." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 16යි.)

5. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) මෙගස්තිනීස්
(ii) ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය
(iii) නන්ද රාජවංශය
(iv) අර්ථශාස්ත්‍රය

(ලකුණු 08 × 2 = 16 යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## C කොටස

6. අලහබාද් ප්‍රශස්තිය ඇසුරෙන් සමුද්‍රගුප්ත රජුගේ කාර්ය සාඵල්‍යය පරීක්ෂා කරන්න. (ලකුණු 16යි.)

7. (i) හර්ෂවර්ධන රජුගේ රාජධානියේ අගනුවර නම් කරන්න. (ලකුණු 01යි.)
   (ii) 'හර්ෂචරිත' නමැති කෘතියේ කතුවරයා නම් කරන්න. (ලකුණු 01යි.)
   (iii) හර්ෂවර්ධන රජු විසින් රචනා කරන ලද ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (iv) හර්ෂවර්ධන රජුගේ දේශපාලන, සංස්කෘතික හා ආගමික කාර්ය සංසිද්ධීන් සාකච්ඡා කරන්න. (ලකුණු 12යි.)

8. පහත දැක්වෙන ශීර්ෂ යටතේ චෝළ බලය ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳ විස්තර කරන්න.
   (i) දකුණු ඉන්දියාවේ චෝළ බල ව්‍යාප්තිය
   (ii) ඉන්දියාවෙන් පිටත චෝළ බල ව්‍යාප්තිය (ලකුණු 16යි.)

9. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   (i) කුෂාණ රාජවංශය
   (ii) ගෞතමීපුත්‍ර සාතකර්ණී
   (iii) දෙවන චන්ද්‍රගුප්ත යටතේ ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය
   (iv) පල්ලව කලා හා ගෘහනිර්මාණ ශිල්පය (ලකුණු 08 × 2 = 16යි.)

* * *



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | |
|---|---|---|
| ඉන්දීය ඉතිහාසය II<br>இந்திய வரலாறு II<br>History of India II | 25 A | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. } 1

විභාග අංකය / சுட்டெண் / Index No. } ..............................






Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025

ඉතිහාසය II (II කොටස)

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

උපදෙස්:
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.
- II කොටස A, B හා C ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
- A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් I කොටස සමග සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | |
|---|---|
| (i) තක්ෂිලා | (ii) රාවි |
| (iii) චන්හුදාරෝ | (iv) තානේශ්වර් |
| (v) බරණැස | (vi) ගුජරාට් |
| (vii) තප්ති | (viii) අයිහෝලේ |
| (ix) හිමාලය කඳුවැටිය | (x) කොරමැන්ඩල් වෙරළ |
| (xi) සාංචි | (xii) ගංගා |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

2. (i) හරප්පා සහ මොහෙන්ජොදාරෝ නටබුන් සොයා ගත් ඉන්දියානු පුරාවිද්‍යාඥයින් දෙදෙනා නම්

කරන්න.

දයා රාම් ශානි / ආර්. ඩී. බැනර්ජි

(ලකුණු 02 යි)

(ii) හරප්පා සහ මොහෙන්ජොදාරෝ නගරවල කැණීම් කළ බ්‍රිතාන්‍ය පුරා විද්‍යාඥයින් දෙදෙනකු නම් කරන්න.

ඇලෙක්සැන්ඩර් කනිංහැම්, සර් ජෝන් මාර්ෂල්, ස්ටුවට් පිගොට්, ෆෙයාසර්විස්, ~~සී.සී. අග්‍රවාල්~~ අර්නස්ට් මැකේ, මෝටිමර් විලර්.

(ලකුණු 02 යි)

(iii) (a) මහා ධාන්‍යාගාරයේ නටබුන් හමු වූ නගරය නම් කරන්න.

මොහෙන්ජොදාරෝ
හරප්පා

(ලකුණු 01යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(b) ඉන්දුනිම්න වැසියන්ගේ ප්‍රධාන වරාය නම් කරන්න.

ලෝතාල්

(ලකුණු 01යි)

(iv) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නගර නිර්මාණය සහ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ විස්තරයක් කරන්න,

<u>නගර නිර්මාණය</u>

- ඉතා දියුණු වාස්තු විද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිතය.
- මුළුමනින්ම නාගරික ලක්ෂණ පැවතීම.
- විශාලතම නගර මොහෙන්ජොදාරෝ, හරප්පා නගරද්වයයි.
- මෙම නගරවල සැලසුම බොහෝ දුරට එක සමානය. විධිමත් හා සැලසුම් සහගතව නිර්මාණ කර ඇත.
- ඊට සමාන කුඩා නගර සමූහයක් පැවතිණ.
- සෑම නගරයක්ම කොටු පවුරකින් වට කළ උස් ගොඩැල්ලක ඇතුළු නුවර හා පිටි නුවර වශයෙන් වශයෙන් නිර්මිතය (ගංවතුරෙන් ආරක්ෂාවට).
- ඇතුළු නුවර - ආයත චතුරස්‍රාකාර (ප්‍රභූන් සඳහා); පිටිනුවර - සමචතුරස්‍රාකාර.
- ගොඩැල්ලට නැගීමට අලංකාර පඩි පේළියක් පිහිටා ඇත.
- කිරි මැටි, ජිප්සම්, හුණු මිශ්‍රිත බදාම.
- සියලුම ඉදිකිරීම්වල දී ගංවතුරෙන් ආරක්ෂාවීම හා සතුරු ආක්‍රමණවලින් ආරක්ෂාවීම පිළිබඳව අවධානය යොමු කිරීම.
- පිටිනුවර අවස්ථා කිහිපයකදී නැවත නැවත ඉදිකර ඇති බවට සාධක ඇත.
- පිටිනුවර - කර්මාන්ත ශාලා, නගරවැසි නිවාස, කම්කරු නිවාස, ජල නල, ළිං, අප ජල මාර්ග, කාණු.
- නගරයට ඇතුළුවීමේදී උතුර හා දකුණ වශයෙන් මහවීදි දෙකක් හඳුනාගත හැකිය. මේ දෙක හමුවන ස්ථානය ඔක්ස්ෆර්ඩ් චතුරශ්‍රය වශයෙන් නම් කොට ඇත. අනෙක් පටුමාර්ග හා වීදි ප්‍රධාන මාර්ගයට සම්බන්ධ කරමින් සෘජුකෝණාස්‍රාකාර ලෙස නිමවා ඇත.
- සෘජු රේඛීයව විහිදුණු වීදි හා වීදි ලාම්පු දක්නට ඇත.

<u>ගෘහ නිර්මාණය</u>

- සියලු නිර්මාණ සඳහා ගඩොල් භාවිත කිරීම
- අමු ගඩොල් හා පිළිස්සූ ගඩොල් ද ඊට අමතරව පාෂාණ වර්ග ද යොදා ගෙන තිබේ.
- ඉදිකිරීම්වලට උචිත වන පරිදි විවිධ ප්‍රමාණවලින් හා හැඩවලින් යුක්ත ගඩොල් භාවිතකර තිබීම.
- ගැඹුරට හාරා ගත් අඩිතාලමක පාදම පොළොව මට්ටමින් උස් කොට ගඩොලින් බැඳීම.
- ලම්බකව බිත්ති බැඳීම.
- ශක්තිමත්ව බිත්ති බැඳීම සඳහා පිළිස්සූ ගඩොල් හා අමු ගඩොල් භාවිතය.
- ප්‍රධාන වීදිවලට පිටුපා ගොඩනැගිලි ඉදි කර ඉදිරිපස දොරටුව අතුරු මාර්ගයට මුහුණලා තැබීම.
- උඩුමහලක් සහිත නිවාස.
- ජනෙල් වෙනුවට කුඩා සිදුරු.
- හතරැස් හැඩයේ කුළුණු.
- ධනවතුන්ගේ නිවාස වඩා විශාල හා මහල් නිවාස වීම.
- සාමාන්‍ය ජනයාගේ නිවාස තනි මහල්ය.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- කම්කරු නිවාස, පේළි නිවාස.
- මහා ධාන්‍යාගාරය, මහා ස්නානාගාරය.
- අප ජලය බැහැර කිරීමට කාණු පද්ධතිය.

(ලකුණු 10 යි)

**3. ඍග් වෛදික යුගයේ පැවති දේශපාලන, සමාජ සහ ආගමික තත්ත්වයන් පශ්චාත් වෛදික යුගයේදී**
**වෙනස්වී ඇති ආකාරය පැහැදිලි කරන්න.**

**දේශපාලන වෙනස්වීම්**

- ඍග් වෛදික යුගයට අයත් *ඍග් වේදය* හා පශ්චාත් වෛදික අවධියට අයත්යැයි සැලකෙන *යජුර්, සාම, අථර්වන්, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද්* යන ග්‍රන්ථ මේ සඳහා මූලාශ්‍ර කර ගත හැකිය.
- *ඍග් වේදයෙන්* අනාවරණය වන කාලය ඍග් වෛදික යුගය ලෙසත් *යජුර්, සාම, අථර්වන්, බ්‍රාහ්මණ, අරණ්‍යයක* හා *උපනිෂද්* ග්‍රන්ථවලින් හෙළිවන කාලය පශ්චාත් වෛදික සමය ලෙසත් හැඳින්වේ.
- ඍග් වෛදික යුගයේ දේශපාලන කටයුතුවලදී ගෝත්‍රික සංවිධානයට ප්‍රමුඛතාවක් හිමි වූ අතර රාජන් යන නාමයෙන් ගෝත්‍රයෙහි නායකයා හැඳින්වේ.
- බලවත් ගෝත්‍ර (භරත, පුරු, යදු, තුර්වාශ).
- පශ්චාත් වෛදික යුගයේදී සංකීර්ණ ස්ථාවර සමාජයක් බවට පරිවර්තනයවී නායකයා රජු විය.
- *ඓතරේය බ්‍රාහ්මණ ග්‍රන්ථයට* අනුව:

  සාම්රාට් - පෙරදිග රජවරුන්
  භෝජ - දකුණේ රජවරුන්
  විරාට් - උතුරේ රජවරුන්
  රාජන් - මධ්‍යම ප්‍රදේශයේ රජවරුන් (පංජාබය හා වර්තමාන උත්තර ප්‍රදේශය)

- පශ්චාත් වෛදික යුගයේ පාලකයාට දේවත්වය ආරෝපණය කිරීම හා රාජත්වය පාරම්පරික උරුමයක් බවට පත් කිරීම.

  උදා: *මනුස්මෘතියේ* රජු විසින් අශ්වමේධ සහ රාජශුය යන යාගයන් සිදු කිරීම.

- ඍග් වෛදික යුගයේ පැවති සමිති හා සභා එලෙසම පශ්චාත් වෛදික යුගයේදී ක්‍රියාත්මක වීම.

  උදා: සභා - ගෝත්‍රයේ වැඩිහිටියන්ගේ මණ්ඩලය

  සමිති - සියලුම ගෝත්‍රික ප්‍රජාව නියෝජනය කරන මණ්ඩලය.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- ඍග් වෛදික යුගයේ පාලනයට සහාය වූ නිලධාරීන්

  උදා: පුරෝහිත /සේනානි /විශ්වපති / ග්‍රාමණී

- පශ්චාත් වෛදික යුගයේ රජුට සහාය වූ නිලධාරීන් රත්නීන් හෙවත් රාජකෘත් (රජුන් තනන්නන්) ලෙස හැඳින්වීම.

  උදා: පුරෝහිත, සේනානි - සෙන්පති, ග්‍රාමණී - ග්‍රාම ප්‍රධානීන්, සංග්‍රහිතෘ - භාණ්ඩාගාරික, භාගදුග - ආදායම් නිලධාරී, අක්ෂවාපී - සූදු පාලක, උග්‍ර - පොලිස් නිලධාරී, ගෝවිකර්තන - දඩයමේදී සහාය වන්නා, පාලාගල - දූතයා, ක්ෂත්‍රී - ඡත්‍ර දරන්නා, තක්ෂන් - වඩුවා.

- රජුට ගෙවිය යුතු බලි සිය නිෂ්පාදනයෙන් හෝ ගවයන්ගෙන් ගෙවීම.

**සමාජ වෙනස්වීම්**

- ඍග් වෛදික යුගයේ සමාජයේ මූලික පදනම ලෙස සැලකුයේ කුල නමින් හැඳින්වූ පවුලයි.
- පශ්චාත් වෛදික යුගයේ වර්ණ ක්‍රමය තදින් මුල්බැස ගැනීම:

  උදා: බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර

- මෙම වර්ණවලට රැකියා වෙන් කිරීම *මනුස්මෘතියේ* 'ස්වධර්ම' වශයෙන් හැඳින්වීම.
- පශ්චාත් වෛදික යුගයේ වර්ණාශ්‍රම ධර්ම ක්‍රියාත්මක වීම.
- ඍග් වෛදික යුගයේ කාන්තාව නිදහස භුක්ති විඳ ඇති අතර පශ්චාත් වෛදික යුගයේ මුළුමනින්ම ඔවුන්ගේ නිදහස සීමා වීම.

**ආගමික වෙනස්වීම්**

- ඍග් වෛදික යුගයේ බහුදේවවාදී ආගමික රටාවක් දක්නට ලැබීම.
- යහපත හා අයහපත මුල් කොට ගෙන ජලය, සුළඟ, ගින්න, වර්ෂාව, පොළොව, හෙණ, වෘක්ෂ, පර්වත ආදි ස්වාභාවික වස්තූන්ට වන්දනා කිරීම.
- වරුණ, වායු, පෘථිවි, මිත්‍ර, අග්නි, රුද්‍ර, පර්ජන්‍ය, ඉන්ද්‍ර ආදි දෙවිවරුන් ප්‍රධාන වීම.
- දෙවිවරුන් වසන ස්ථාන අනුව වර්ග කිරීම.

  උදා: අහසේ වසන - වරුණ, මිත්‍ර, සාවිත්‍රි, සූර්ය,

  පොළොවේ වසන - පෘථිවි, අග්නි, සෝම, යම

  අන්තරීක්ෂයේ වසන ඉන්ද්‍ර, රුද්‍ර, මරුත්, වායු

- පශ්චාත් වෛදික යුගයේදී බහුදේවවාදය ඒකදේවවාදයක් බවට පත් වීම.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

උදා: ප්‍රජාපති සංකල්පය තවදුරටත් සවිස්තර වූ අතර ඔහුම 'විශ්ව ව්‍යාපී බ්‍රහ්මන්' ලෙස ප්‍රමුඛස්ථානයට පත්විය. විෂ්ණු හා රුද්‍ර (ශිව) මේ අවධියේ පෙරමුණට ආ දෙවිවරුන්ය.

සූර්ය, මිත්‍ර, සාවිත්‍රි, වරුණ යන දෙවිවරුන් සතර දෙනාම සූර්ය දෙවි බවට පත් වීම. (බහුදේව වාදය ඒක දේවවාදයට නිදසුන්).

- සරලව පැවති යාගය පශ්චාත් වෛදික යුගයේ සංකීර්ණ වීම.
- බ්‍රාහ්මණ බලය වඩාත් තදින් ආගමික කටයුතුවලට බලපෑම් කිරීම.
- බ්‍රාහ්මණ බලයට විරුද්ධව ශ්‍රමණ සම්ප්‍රදාය ඉස්මතු වීම

(ලකුණු 16 යි)

**4. ''අශෝක රජු මෞර්ය අධිරාජ්‍යයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයා විය'' මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ**

**ද? හේතු දක්වන්න.**

- රාජ්‍ය උරුමය ලබාගැනීමට කටයුතු කළ ආකාරය.
- රාජ්‍ය බල ව්‍යාප්තිය සඳහා දිග් විජය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම - කාලිංග යුද්ධය.
- චන්ද්‍රගුප්ත මෞර්ය සමයේ ගොඩනැගූ පරිපාලන ක්‍රමය එලෙසම පවත්වාගෙන යාම - ප්‍රාන්ත පාලනය, නගර පාලනය, අධිරාජ්‍යයේ ආදායම් පාලනය, අධිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම.
- කාලිංග දේශය ආක්‍රමණය කිරීමෙන් පසුව දිග් විජය ප්‍රතිපත්තිය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තියට අවතීර්ණ වීම.
- 'අශෝක ධර්මය' නමින් හැඳින්වෙන මෙම ප්‍රතිපත්තිය බෞද්ධාගමින් පෝෂණය වූවක් බව පැහැදිලිය. එහෙත් ඉන්දියාවේ සියලු ආගම්වල සාරය ඇතුළත් ධර්මයක් බවටද අදහසක් පවතී.
- අශෝක ධර්මය තුළින් ධාර්මික සමාජයක් බිහි කිරීමට උත්සාහ දරා ඇති බව - කරුණාව, දන්දීම, සත්‍යවාදී බව, පිරිසිදු බව අගය කිරීම, මව්පියන්ට හා වැඩිහිටියන්ට ගරු කිරීම, සතුන්ට කරුණාව දැක්වීම, දැසිදස්සන්ට කාරුණික වීම ආදී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.
- 'සියලු රටවැසියන් මාගේ දරුවෝය' යන ප්‍රකාශය ඉදිරිපත් කරමින් කටයුතු කිරීම. (ධෞලි ගිරි ලිපිය)
- ධර්මය ව්‍යාප්ත කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග. රටපුරා පිහිටුවන ලද සෙල්ලිපි හා අශෝක ස්ථම්භ මගින් ප්‍රචාරය කිරීම, ධර්ම මහාමාත්‍යවරුන් පත්කිරීම, මේ සියල්ල ධාර්මික සමාජයක් නිර්මාණය කරලීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයන්ය.
- සමාජ සුභ සාධනය ඉදිරිපත් කරමින්, මිනිස් හා තිරිසන් සමාජ වෙනුවෙන් ප්‍රතිකාර ක්‍රම පවත්වා ගෙන යාම, ළිං හෑදීම, මාර්ග දෙපස ගස් සිටුවීම, පැන්හල් ඉදිකිරීම, ඖෂධ උයන් නිර්මාණය කිරීම.
- තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීමට අනුග්‍රහය දැක්වීම, රටවල් 9කට ධර්මදූතයන් යැවීමට ක්‍රියාකිරීම.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- සියලු ආගමික කණ්ඩායම්වලට සහනශීලි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
- ධර්ම විජය ප්‍රතිපත්තියක් තුළින් විදේශ රාජ්‍යයන් සමඟ සමීප සබඳතා පවත්වා ගෙන යාම.
- මේ අතර මෞර්ය අධිරාජ්‍යයේ පරිහානියට අශෝක රජුගේ ප්‍රතිපත්තීන් මුල්වී ඇති බවටද අදහසක් ඇත. සතුන් බිලිදීම තහනම් කිරීම, ධර්ම මහාමාත්‍රවරු පත්කිරීම, අධිකරණ කටයුතුවලදී හා දඬුවම් දීමේදී එතෙක් ලැබූ විශේෂත්වය අහිමිවී යාම ආදිය මුල්කර ගෙන ඇත් වූ බ්‍රාහ්මණයන්ගේ විරෝධය පරිහානියට මුල් වූ බව.

(ලකුණු 16 යි)

5. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) මෙගස්තිනිස්

(ii) ක්‍රි.පූ. හයවැනි සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය.

(iii) නන්ද රාජවංශය

(iv) අර්ථශාස්ත්‍රය

(ලකුණු 8 x 2 = 16 යි)

(i) මෙගස්තීනිස්

- මෞර්ය රාජ සභාවේ සිටි ග්‍රීක තානාපතිවරයාය.
- සෙලියුකස් නිකේටර්ගේ දූතයකු ලෙස චන්ද්‍රගුප්තගේ රාජ සභාවේ සේවය කිරීම.
- පාඨලීපුත්‍ර නගරයෙහි සිය දීර්ඝකාලීන අත්දැකීම් ගොනුකොට "ඉන්ඩිකා" කෘතිය රචනා කිරීම.
- එකල ඉන්දියාවේ තොරතුරු රැසක් එහි ඇතුළත්වීම.
- පාඨලීපුත්‍ර නගරය පිළිබඳව දීර්ඝ තොරතුරු ඇතුළත්වීම.
- මණ්ඩල හයකින් නගර පාලනය සිදු කිරීම.
- එකල පැවති සමාජය පිළිබඳ තොරතුරු.
- මෞර්ය යුද හමුදා සංවිධානය.
- මෞර්ය අධිකරණ හා දඬුවම් ක්‍රම.
- බදු අය කිරීම.
- අධ්‍යාපන ක්‍රමය.
- රන් කර්මාන්තය ආදි තොරතුරු ඔහු සිය කෘතිය තුළින් ගෙනහැර දක්වා ඇත.

(ලකුණු 08 යි)

(ii) ක්‍රි. පූ. හයවැනි සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- ➢ බෞද්ධ හා ජෛන ග්‍රන්ථවල මෙම අවධියේ පැවති දේශපාලන ඒකක පිළිබඳව තොරතුරු සඳහන්ව ඇත.
- ➢ සොළොස් මහා ජනපද - අංග, මගධ, කාසි කෝසල, වජ්ජි, මල්ල, චේදි, වත්ස, මත්ස්‍ය, කුරු, පංචාල, සූරසේන, අස්මක, අවන්ති, ගාන්ධාර, කාම්බෝජ.
- ➢ මෙම ජනපද එකිනෙකා අභිබවා යාමට උත්සාහ දැරීම මේ අවධියේ දක්නට ලැබුණු ලක්ෂණයකි.
- ➢ රාජාණ්ඩු හා සමූහාණ්ඩු ලෙස මෙම ජනපද වර්ධනය වීම.
- ➢ සොළොස් මහා ජනපද අතරින් මගධ, කෝසල, වත්ස, අවන්ති ප්‍රධාන රාජාණ්ඩු ලෙස වර්ධනයවී ඇත.
- ➢ තනි පුද්ගලයෙකු රාජාණ්ඩුවක පාලකයා වීම.
- ➢ ඔහු ඉතා බලවත් අයෙකු වීම.
- ➢ රජුගේ බලය සීමා කිරීමට මන්ත්‍රී පර්ෂද් පාලන සංවිධානයට එකතුවීම.
- ➢ පුරෝහිත, සේනාපති ආදි වශයෙන් නිලධාරී කණ්ඩායමක් පාලනයට සහායවීම.
- ➢ චතුරංගනී සේනාවක් යොදවා රාජ්‍යය ආරක්ෂා කිරීම.
- ➢ රාජාණ්ඩු මත්ස්‍ය න්‍යාය අනුගමනය කිරීම තුළින් අනෙකුත් රාජ්‍යයන් ගිලගැනීමට කටයුතු කිරීම.
- ➢ විවාහ සබඳතා මගින් විවිධ රාජ්‍යයන් සමඟ දේශපාලන සබඳතා ඇතිකර ගැනීම හා තම පාර්ශ්වයට අවනත කරගැනීම.
- ➢ වජ්ජි හා මල්ල වැනි ජනපදවල සමූහාණ්ඩු පාලනයක් පැවතීම.
- ➢ සමූහාණ්ඩු පාලනයක් තුළ සප්ත අපරිහානිය ධර්ම අනුගමනය කිරීම
- ➢ වජ්ජි හා මල්ල වැනි සමූහාණ්ඩුවලට අමතරව ගණ රාජ්‍යයන් නවයක් දක්නට ලැබීම.

  1. කපිලවස්තුවේ - ශාක්‍යවරු
  2. පාවා හා කුසිනාරාහි - මල්ලවරු
  3. වෛශාලියේ - ලිච්ඡවීන්
  4. රාමගාමයේ - කෝලියවරු
  5. අල්ලකප්පයේ - බූලිවරු
  6. කේසපුත්තයේ - කාලාමවරු
  7. පිප්ඵලිවනයේ - මෝරියවරු
  8. සුංසුමාරගිරියේ - වග්ගයන්
  9. මිථිලාවේ - විදේහවරු

- ➢ මේවායේ පාලකයෝ ගණපති, ගණ ජ්‍යෙෂ්ඨ ලෙස හැඳින්වීම
- ➢ විධායක සභාවක් පාලනයට සහාය වීම.
- ➢ සන්ථාගාර ශාලාව තුළ පරිපාලන කටයුතු සිදු විය.
- ➢ අධිකරණ කටයුතු ප්‍රවේණි පුස්තකයට අනුව සිදු විය.

(ලකුණු 08 යි)

**(iii)** නන්ද රාජ වංශය



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- සිසුනාගයන්ට පසුව මගධයේ පාලන බලයට පත්වන්නේ නන්ද රාජවංශිකයන්ය.
- මෙම රාජවංශයේ පළමු පාලකයා මහාපද්මනන්ද වන අතර ඔහු සිසුනාග පරපුරේ අවසන් පාලකයා මරා දමමින් බලයට පත්විය.
- මෙම පරපුර ක්ෂත්‍රිය නොවන බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. ඔවුන් ශුද්‍ර වංශය නියෝජනය කරන බව කියැවේ.
- නන්ද පාලකයන් නව දෙනකු (09) පිළිබඳව සඳහන් වේ. එනම්

  1. උග්‍රසේන 2. පණ්ඩුක 3. පණ්ඩුගති 4. භූතපාල 5. රාෂ්ට්‍රපාල 6. ගොවිශානක

  7. දශසිද්ධක 8. කයිවර්ත 9. ධනනන්ද.

- මහාපද්මනන්ද රජු 'සර්ව ක්ෂත්‍රිය කුලනාශක' යනුවෙන්ද පුරාණ ග්‍රන්ථවල හඳුන්වා තිබේ.
- මොහු මගධයේ ප්‍රථම මහා අධිරාජ්‍යය ගොඩනැගූ පුද්ගලයා ලෙස ඉතිහාසගත වේ.
- මහාපද්මනන්ද රජු කූටෝපායෙහි දක්ෂ රණශූර පාලකයෙකි.
- මෙම රාජවංශයේ පාලකයන් විසින් ඉක්ෂ්වාකු, පංචාල, කාශි, හෛහය, කලිංග, අශ්මක, කුරු, මෛථිර, ශූරසේන, විතිහෝත්‍ර යන වංශ යටත් කරගෙන ඒවාට අයත් ප්‍රදේශ මගධයට එකතු කළ බව පුරාණ ග්‍රන්ථවල සඳහන් වේ.
- ග්‍රීක ලේඛනවල මෙම පරපුරේ අවසන් පාලකයා වන ධනනන්ද පිළිබඳව සඳහන් වේ.
- මොහු ජනතා අප්‍රසාදයට ලක් වූ අයෙකි.
- ජනතා අප්‍රසාදය පැවති නමුත් බලවත්ව සිටි නිසා ග්‍රීක ආක්‍රමණිකයන් ගැටුම් ඇති කරගැනීමෙන් වැළකී ඇත.
- වයඹ දිග ඉන්දියාවට ග්‍රීක ආක්‍රමණ එල්ල වන විට උතුරු ඉන්දියාවේ පාලකයා ලෙස කටයුතු කළේ ධනනන්ද රජුය.
- ධනනන්දගෙන් එම රාජවංශය අවසන් වන අතර ඔහුගෙන් පසුව මෞර්ය වංශික චන්ද්‍රගුප්ත මගධයේ පාලකයා බවට පත් වේ.

**(ලකුණු 08 යි)**

(iv) **අර්ථශාස්ත්‍රය**

- චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ පුරෝහිතයා වූ කෞටිල්‍ය හෙවත් චාණක්‍ය /විෂ්ණු ගුප්ත විසින් රචිතය.
- රජුගේ 'ධන ලාභය, දිග්විජය, ප්‍රජාපාලනය' යනාදි අරුත් ගැබ්වෙන ආකාරයෙන් ***අර්ථශාස්ත්‍ර*** යනුවෙන් ග්‍රන්ථයට නම් තබා ඇති ආකාරයක් දිස්වේ.
- අධිකරණ හා ප්‍රකරණ යනුවෙන් කොටස් දෙකකින් සමන්විත මෙම ග්‍රන්ථය ශ්ලෝක හා ගද්‍ය කොටස්වලින් සමන්විතය.
- ***අර්ථශාස්ත්‍රය***, විනය පිළිබඳ ප්‍රථම අධිකාරය, රජයේ අධ්‍යක්ෂවරුන්ගේ කාර්යභාරය, න්‍යාය නිරූපණය, කටුකොහොල් ඉවත් කිරීම, රාජ්‍ය සේවකයන්ගේ චර්යාව, ස්වාධීන රාජ්‍යයක මූලාශ්‍රය, විදේශ ප්‍රතිපත්තිය, ව්‍යසනාධිකාරිකය, යුද්ධය සඳහා පිටත් වීම, සාංග්‍රාමික,



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සංසවෘත්ත, බලවත් සතුරා පිළිබඳ සලකා බැලීම, බලකොටුවලට පැමිණීම, ඖපනිෂදික, තන්ත්‍ර යුක්ති ආදි වශයෙන් අධිකාර පසළොසකින් සමන්විතය.

- මෙය රචනා කිරීමේදී පැරණි ඉන්දීය පාලන ක්‍රම හා තත්කාලීන ලෝකයේ පැවති පාලන ක්‍රම බොහොමයක තොරතුරුද යොදා ගෙන ඇත.
- බ්‍රාහ්මණ වරප්‍රසාද පිළිබඳව පුළුල් විග්‍රහයක් කර ඇත.
- බදු අය කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ පිළිබඳ තොරතුරු සමූහයක් දක්වා ඇත.
- රාජ්‍ය නිලධාරීන් පිළිබඳ බොහෝ තොරතුරු අඩංගු වේ.
- රාජ්‍ය පාලනය සම්බන්ධ අත්පොතක් ලෙසද භාවිත කළ හැකි කෘතියකි.
- ආචාර ධර්ම නොසලකා දේශපාලන බල වර්ධනය කිරීමේ වැදගත්කම දක්වා ඇත.

**(ලකුණු 08 යි)**

## C කොටස

**6. අලහාබාද් ප්‍රශස්තිය ඇසුරින් සමුද්‍රගුප්ත රජුගේ කාර්ය සාඵල්‍යය පරීක්ෂා කරන්න.**

- සමුද්‍රගුප්ත රජුගේ කාර්ය සාඵල්‍යය පිළිබඳව හැදෑරීමට ඇති ප්‍රධානතම මූලාශ්‍රය අලහාබාද් ප්‍රශස්තියයි.
- වර්තමානයේ මෙය අලහාබාද්හි පිහිටා තිබෙන බැවින් මෙය 'අලහාබාද් ප්‍රශස්තිය' නමින් හඳුන්වයි. මෙය කෞසම්බියේ තිබී අලහාබාද් වෙත ගෙනැවිත් ඇත්තේ මුගල් පාලක මහා අක්බාර් රජතුමා විසිනි.
- සමුද්‍රගුප්ත රජුගේ රාජ සභා කවියා වූත් කුමාරාමාත්‍යවූත්, දණ්ඩනායක වූත් හරිසේන කවියා විසින් සමුද්‍රගුප්ත රජුගේ ගුණ වයමින් රචනා කොට ඇති බැවින් එය අලහාබාද් ප්‍රශස්තිය ලෙස නම් කොට ඇත.
- මෙම ලේඛනය සංස්කෘත භාෂාවෙන් රචනා කරන ලද්දකි. එහි ශ්ලෝක 08 ක් දක්නට ලැබෙන අතර ඉතිරි කොටස ගද්‍ය පාඨවලින් සමන්විත වූවකි. ශ්ලෝක ඇති කොටසේ ඇතැම් තැන් කැඩී බිඳී ගොස් ඇති බැවින් සම්පූර්ණ අදහස ගැනීමට නොහැකිවී තිබේ.
- ප්‍රශස්තියේ අභිමුඛයේ ධර්මාශෝක රජතුමාගේ ලිපියක්ද අන්තර්ගතව ඇත; ප්‍රතිමුඛයේ ඇත්තේ අලහාබාද් ප්‍රශස්තියයි.
- 1 සහ 2 වන ශ්ලෝකවලින් කියැවෙන්නේ කුමක්ද යන්න නිශ්චිතව කිව නොහැකි වන්නේ එය කැඩී බිඳී ගොස් ඇති බැවිනි. නමුත් එයින් ගුප්ත රාජවංශයේ පළමු පාලකයා වන චන්ද්‍රගුප්ත පිළිබඳව යමක් කීමට උත්සාහ ගත් බවක් පෙනී යයි. 3 වන ශ්ලෝකයෙහි අවධානය යොමුවී ඇත්තේ සමුද්‍රගුප්ත රජුගේ උගත්කම හා ඔහු කලාවට දැක්වූ ලැදියාව පෙන්වා දීමටය. එහිදී ඔහු 'කවිරාජ්' යනුවෙන් හඳුන්වා ඇත. එසේම ඔහු සංගීතයට විශාල ලැදියාවක් දැක්වූ බවද එහි සඳහන්ය. 4 වන ශ්ලෝකයෙන් ඔහුට පියා විසින් රාජ්‍ය උරුමය පවරාදීම පිළිබඳවත් 5 සහ 6 යන ශ්ලෝක දෙකෙන් රජකම ලබාගත් ආකාරයත් ඒ දෙස රජ ගෙදර අය බලා සිටි ආකාරයත් විස්තර කෙරේ. 7 හා 8 යන ශ්ලෝකවලින් සමුද්‍රගුප්ත රජුගේ යුද ජයග්‍රහණ විස්තර කෙරේ.
- අලහාබාද් ප්‍රශස්තියේ සමුද්‍රගුප්ත රජුගේ දික්විජය ප්‍රතිපත්තිය ප්‍රදේශ හතරක් යටතේ විවරණය කෙරේ.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

01. **ආර්යාවර්තයේ ලබන ලද ජයග්‍රහණය**

රුද්‍රදේව, මතිල, නාගදත්ත, චන්ද්‍රවර්ම, ගණපතිනාග, නාගසේන, අච්‍යුත, නන්දි, බලවර්මා යන උත්තර භාරතීය රජුන් පරාජය කර ඔවුන්ගේ රාජ්‍යයන් ගුප්ත රාජ්‍යයට එකතු කරන ලදී.

02. **දක්ෂිණාපථයේ රාජ්‍යයන් 12 යටත් කොට ගැනීම.**

දකුණු කෝසලයේ - මහේන්ද්‍ර, මහා කාන්තාරයේ - ව්‍යාඝ්‍රරාජ, කෞරලක මණ්ටරාජ, පෛෂ්ටකපූරක (පිෂ්ටපුරයේ) - මහේන්ද්‍රගිරි හා කොට්ටූරක - ස්වාමිදත්ත (මේ දෙදෙනා එකටම දක්වා ඇත), ඒරණ්ඩපල්ලක - දමන, කාඤ්චෙයන - විෂ්ණුගෝප, අවමුක්තක - නීලරාජ, වෛංගේයක - හස්තිවර්මන් පාලක්කයේ - උග්‍රසේන, දේවරාෂ්ට්‍රක - කුබේර කෞස්ථලපූරක - ධනඤ්ජය (මේ ප්‍රශස්තියේ සඳහන්ව ඇති ආකාරය හා පිළිවෙළය).

03. **ප්‍රත්‍යන්ත රාජ්‍යයන් ජයග්‍රහණය කිරීම**

දක්ෂිණාපථ රජුන් පරාජයට පත්කිරීමෙන් පසුව සීමාන්ත රජවරුන් (ප්‍රත්‍යන්ත රජවරුන්) ජය ගැනීමට කටයුතු කළේය (සමතට, ද්වාක, කාමරූප, නේපාලය, කර්තෘ පුර) යන රාජ්‍යයන් ජයගත් බව ප්‍රශස්තියේ සඳහන්ව ඇත.

04. **ගණ රාජ්‍යයන් පරාජයට පත්කිරීම**

නැගෙනහිර හා උතුර ජයග්‍රහණය කිරීමෙන් පසුව බටහිර ඉන්දියාව ජයග්‍රහණය කිරීමට කටයුතු කළේය. සමුද්‍රගුප්ත විසින් මෙම ගණ රාජ්‍යයන් මුළුමනින්ම විනාශ කළේ යැයි සඳහන් වේ. මෙයින් භාරතයේ ගණ රාජ්‍ය පාලනය අවසන් විය.

මාලව, ආර්ජුනායන, යෞධෙය, මද්‍රක, ආභීර, ප්‍රාර්ජුන, සනකානීක, කාක, ඛර්පරික යන ගණ රාජ්‍යයන් සමුද්‍රගුප්ත අතින් අවසන් වූ රාජ්‍යයන්ය.

- ඉහත සඳහන් කරන ලද යුද ජයග්‍රහණවලින් පසුව සමුද්‍රගුප්තගේ දිග් විජය පිළිබඳව වූ ආරංචිය ඈතදිග දේශයන්හි පැතිර ගියේය. මේ නිසා සමීප රාජ්‍යයන්ට ඔහු සමග මිත්‍රත්වයක් ඇති කරගැනීමට සිදුවිය. ඒ අනුව විදේශීය රජවරු හුදෙක් මිත්‍රත්වය පමණක් නොව නොයෙක් දේ ඔහුට තෑගි කළහ. මේ පාලකයන් ආත්මනිවේදන (රාජ්‍ය සේවයට සේවකයන් යැවීම් ආදිය), කන්‍යෝපායනය (සිය දියණියන් ප්‍රදානය කිරීම), ගරුඩ මුද්‍රා පිළිගැනීම (විෂය හා භුක්ති පාලනය සඳහා ගරුඩ ආකෘතියෙන් මුද්‍රිත ආඥාපත්‍ර ඉල්වා ගැනීම) කරන ලදී.

දෛවපුත්‍ර ශාහි, ශාහානුශාහි, ශක, මුරුණ්ඩ, සෛංහල යන රාජ්‍යයන් සමුද්‍රගුප්ත සමග මිතුරු බව ඇති කරගත් රාජ්‍යයන්ය.

සමුද්‍රගුප්ත රජ තමාට පුද පඬුරු යැව්වේයැයි අලහාබාද් ප්‍රශස්තිය වාර්තා කරන සෛංහලක රජු එවකට ශ්‍රී ලංකාව පාලනය කළ මේඝවර්ණාභය රජු ලෙස සලකනු ලබයි.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- රාජ්‍යයේ ප්‍රධාන කොටස් තමා යටතේද ඉතිරි කොටස් යටත් රජවරුන් පවත්නා පරිදි සමුද්‍රගුප්ත රජු සිය බලය ව්‍යාප්ත කොට තිබේ.

(ලකුණු 16 යි)

07. (i) හර්ෂවර්ධන රජුගේ රාජධානියේ අගනුවර නම් කරන්න.

කනෞජය/ කන්‍යාකුබ්ජය

(ලකුණු 01යි)

(ii) 'හර්ෂචරිත' නමැති කෘතියේ කතුවරයා නම් කරන්න.

බාණභට්ට

(ලකුණු 01යි)

(iii) හර්ෂවර්ධන රජු විසින් රචනා කරන ලද ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

රත්නාවලී නාට්‍යය, ප්‍රියදර්ශිකා නාට්‍යය, නාගානන්ද නාට්‍යය

(ලකුණු 02 යි)

(iv) හර්ෂවර්ධන රජුගේ දේශපාලන, සංස්කෘතික හා ආගමික කාර්ය සංසිද්ධීන් සාකච්ඡා කරන්න.

- හර්ෂවර්ධන හෙවත් හර්ෂ රජු පිළිබඳව හැදෑරීමේ ප්‍රධාන මූලාශ්‍රය වන්නේ බාණභට්ටගේ *හර්ෂ චරිතයයි.* මෙයට අමතරව හියුං සාං වාර්තාවලද කරුණු අන්තර් ගත වෙයි.
- රාජ්‍යවර්ධන රජුගෙන් පසුව රාජ ශ්‍රී කුමරියට රාජ්‍ය හිමි වූ නමුත් ඇය එම රාජ්‍ය පිළිනොගැනීම නිසා හර්ෂ රජුට රාජ්‍යය පැවරීම.
- හර්ෂ රජු ථානේශ්වරය හා කන්‍යාකුබ්ජය ඒකාබද්ධ කොට පාලනය මෙහෙයවිය.
- ගුප්ත යුගයෙන් පසුව උතුරු ඉන්දියාව එක්සත් කොට පාලනය කළ අවසන් හින්දු පාලකයා ඔහුය. මේ නිසාම 'මහාරාජ්' හා 'සකල උත්තරාපතනාථ' යන විරුදනාමයෙන් හර්ෂවර්ධන රජු හැඳින්වේ.

**දේශපාලන කාර්ය සංසිද්ධීන්**

- හර්ෂ චරිතයේ සඳහන් වන පරිදි මොහු රාජ්‍යයත්වයට පත්වීමෙන් පසු සමීපස්ථ රාජ්‍යවල රජවරුන්ට යුද්ධය හෝ යටත්වීම යන දෙකින් එකක් තෝරා ගන්නා ලෙස දන්වා ඇත.
- ඒ අනුව හර්ෂවර්ධන රජතුමා ක්‍රියාත්මක කළ දික්විජය ප්‍රතිපත්තියේ ප්‍රධාන අවස්ථා කිහිපයකි.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- වලභී හා ගුර්ජර පාලකයින් හා සටන් කොට ජය ලැබීම.
- චාලුක්‍ය වංශික දෙවන පුලකේෂින් හා සටන් කිරීම.
- සින්දු නිම්නය අසබඩ රාජ්‍යයන් හා සටන් කිරීම.
- මගධ, ගෞඩ, අවුද් කොන්ගෝද යන රාජ්‍යයන් සමග සටන් කොට බලය පැතිරීම.

➢ වලභි ප්‍රදේශය යටත් කොට ගැනීමෙන් පසුව දෙවන ධ්‍රැවසේන රජුට තම දියණිය විවාහ කොට දී බලය තහවුරු කොට ගැනීම.

➢ ත්‍රෛපාර්ශ්වික අරගලයද පෙන්වා දෙමින් හර්ෂවර්ධන රජුගේ යුද ක්‍රියාන්විත පෙන්වාදිය හැකිය.

➢ මෙම සටන් ව්‍යාපාරයේදී වාතාපියේ චාලුක්‍ය වංශික දෙවන පුලකේශී රජතුමා ජයගත් බව අයිහෝල් ලිපියේ සඳහන් වේ. ඉන්පසුව පුලකේශී රජු 'පරමේශ්වර' යන විරුද නාමය භාවිත කොට ඇත.

➢ හර්ෂවර්ධන රජතුමා බෙංගාලයේ පාලක සසංක රජු මියගිය පසුව එම ප්‍රදේශද තමන් යටතට නතුකොට උතුරු ඉන්දියාව පාලනය කළේය.

➢ බ්‍රෝච්හි දද්ද නම් පාලකයා සමග කළ සටනක් පැවැති නමුත් හර්ෂවර්ධන රජුට එය ජය ගැනීමට නොහැකි වූ බව සඳහන්ව ඇත.

**සංස්කෘතික හා ආගමික සංසිද්ධීන්**

➢ ප්‍රථමයෙන් හින්දු ආගමේ අනුගාමිකයෙකු වූ හර්ෂ රජු පසුව බෞද්ධ රජෙකු ලෙස කටයුතු කරමින් සෙසු ආගම්වලටද අනුග්‍රහය දැක්විය.

➢ සෑම ආගමකම දාර්ශනික හා සංස්කෘතික හරය අගය කළේය.

➢ කනෞජයේ බෞද්ධාගමික සම්මේලනයක් පැවැත්විය. මෙය හියුං සාං වාර්තාවේ උත්කර්ෂවත්ව දක්වා තිබේ. මේ සඳහා රජවරු 20 දෙනෙක් සහභාගිවී ඇති අතර දින 21ක් ඔවුන් සමග බෞද්ධ දාර්ශනික මත සාකච්ඡා කොට තිබේ.

➢ බුද්ධ ප්‍රතිමාවක් සුවඳ පැනින් අභිෂේක ගන්වමින් පෙරහැරක් පවත්වා ඇත.

➢ ප්‍රයාගයේ (අලහාබාද්හි) පැවැත් වූ පංච වාර්ෂික මෝක්ෂ පර්ෂද් මහා දානය දින 75ක් පුරා පැවැත්වීම.

➢ ප්‍රයාග මහා දානයේදී බුද්ධ ප්‍රතිමා, ශිව ප්‍රතිමා, සූර්ය ප්‍රතිමා සඳහා වතාවත් කිරීම.

➢ බෞද්ධ භික්ෂූන්, ජෛන පූජකවරුන්, බමුණන්, යාචකයින් හා අනාථයින්හට තම ධනය හා පස් වසක් එකතු කළ රාජ්‍ය ධනය බෙදා දීම.

➢ බෞද්ධ වෙහෙර විහාර ඉදිකිරීම.

➢ බෞද්ධ භික්ෂූන්ට සිව්පසය පිළිගැන්වීම.

➢ නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලයට අනුග්‍රහ දැක්වීම.

(ලකුණු 12 යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

8. පහත දැක්වෙන ශීර්ෂ යටතේ චෝළ බලය ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳ විස්තර කරන්න.

(i). දකුණු ඉන්දියාවේ චෝළ බල ව්‍යාප්තිය.

(ii) ඉන්දියාවෙන් පිටත චෝළ බල ව්‍යාප්තිය

(i) දකුණු ඉන්දියාවේ චෝළ බල ව්‍යාප්තිය.

- විජයාලය රාජවංශය නමින්ද තංජෝරයේ චෝළ රාජවංශය නමින්ද හැඳින් වූ චෝළ අධිරාජ්‍යය අවුරුදු 400 කට අධික කාලයක් පැවතීම.
- විජයාලය රජු පාණ්ඩ්‍යයන් යටතේ අවනත පාලකයකුව සිටි මුත්තරයියර්ගෙන් ක්‍රි. ව. 820 දී පමණ තංජෝරය අල්ලා ගෙන චෝළ රාජ්‍යය ආරම්භ කිරීම.
- විජයාලයගෙන් ආරම්භවී පළමුවන ආදිත්‍ය, පරන්තක, පළමුවන රාජරාජ, පළමුවන රාජේන්ද්‍ර යටතේ චෝළ බලය ව්‍යාප්ත වීම.
- විජයාලගේ පුත් පළමුවන ආදිත්‍ය තොණ්ඩ මණ්ඩලම් ආධිපත්‍ය හිමි කරගෙන, කොංගු ප්‍රදේශය, බටහිර ගංගයින්ගේ අගනුවර වූ තලකාඩ් අල්ලාගෙන බලගතු රාජ්‍යයක් ලෙස චෝළ බලය ව්‍යාප්ත කිරීම.
- පරන්තක විසින් පාණ්ඩ්‍ය බලය බිඳ දැමීමෙන් හා රාෂ්ට්‍රකූටයන් පරාජය කිරීමෙන් චෝළ බලය තහවුරු කිරීම.
- රාෂ්ට්‍රකූට පාලක තුන්වන කෘෂ්ණ තක්කෝලම් සටනින් චෝළ බල ව්‍යාප්තිය තාවකාලිකව නතර කිරීම.
- නැවතත් චෝළ බල ව්‍යාප්තිය පළමුවන රාජරාජ යටතේ ආරම්භ වීම.
- රාජරාජගේ ප්‍රබල නාවික බලය විසින් ත්‍රිවන්ද්‍රම්හිදී කේරළ නාවික හමුදාව විනාශ කිරීම.
- කේරළ, පාණ්ඩ්‍ය බලය මර්දනය කර බලය ව්‍යාප්ත කර ගැනීම.
- බටහිර ගංග රටේ පාලන ප්‍රදේශ තුනක් වූ ගංගවාඩිය, තංගවාඩිය, කෝළම්බවාඩිය ජයගෙන බලය ව්‍යාප්ත කිරීම.
- පාණ්ඩ්‍ය හා කේරළ ප්‍රදේශ යටත් කරගෙන එහි පාලකයන් ලෙස ප්‍රභූන් පත් කිරීම.
- බටහිර චාලුක්‍ය ජයසිංහ රජු පරාජය කර චෝළ බලය ව්‍යාප්ත කිරීම.
- නැගෙනහිර චාලුක්‍ය අගනුවර (වෙංගිය) අල්ලාගෙන තම ආධිපත්‍යය පිළිගත් ශක්තිවර්මන්ට රජකම ලබාදී චෝළ බලය ව්‍යාප්ත කර ගැනීම.
- පළමුවන රාජේන්ද්‍ර රජු විසින් දකුණු ඉන්දියාවේ චෝළ බල ව්‍යාප්තියට මෙහෙය වූ සටන් හා ඔහු ලැබූ ජයග්‍රහණ පිළිබඳ විස්තර තිරුවලංගාඩු තඹ සන්නසේ හා තිරුමලෙයි ගිරි ලිපියේ සඳහන් වීම.
- ශක්තිවර්මන් රජුගේ සහෝදරයා වූ විමලාදිත්‍යට තම දියණිය වූ කුන්දවා කුමරිය සරණපාවාදී චෝළ බලය ව්‍යාප්ත කිරීම.
- තුංගභද්‍රා නදියෙන් උතුරේ සටන් මෙහෙයවා බෙංගාලයේ ගංගානම් නදිය දක්වා බලය ව්‍යාප්ත කිරීම.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) ඉන්දියාවෙන් පිටත චෝළ බල ව්‍යාප්තිය

- දකුණු ඉන්දියාව තුළ චෝළ බල ව්‍යාප්තියෙන් අනතුරුව ඉන් ඔබ්බට ව්‍යාප්ත කිරීමට කටයුතු කළේය.
- එහිදී ශ්‍රී ලංකාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබේ.
- හතරවන උදය රජුගේ කාලයේදී පරාන්තක රජු ලංකාව ආක්‍රමණය කිරීම. එම ආක්‍රමණයේ අරමුණ හතරවන දප්පුල රජුගේ අවධියේදී ශ්‍රී ලංකාවට රැගෙන ආ පාණ්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ ආපසු ලබා ගැනීමයි. එම අරමුණ අසාර්ථක වුවද චෝළයන් අනුරාධපුර නගරය කොල්ලකා විනාශ කර තිබේ.
- මෙම ආක්‍රමණයෙන් පසුව චෝළ පාලකයා වූ පරාන්තක රජු "මදුරෙයියුම් ඊළමුම් කොණ්ඩයි" විරුදය (මධුරාව හා ලංකාව ජයගත් යන අදහසින්) භාවිතයට ගෙන ඇත.
- පළමුවැනි රාජරාජ අවධියද චෝළ අධිරාජ්‍යයේ බල ව්‍යාප්තියට වැදගත් වේ.
- පළමු රාජරාජ පස්වැනි මිහිඳු අවධියේදී (ක්‍රි. ව. 993දී) අනුරාධපුරය ආක්‍රමණය කොට එය කොල්ලකන ලදි.
- ඔහුට පසුව ඔහු පුත් පළමුවැනි රාජේන්ද්‍ර රජු සේනාවක් එවා 1017දී උපක්‍රමිකව පස්වන මිහිඳු රජු අල්ලා ගැනීමට කටයුතු කළේය.
- එම අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ තිබූ පාණ්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ සහ රාජ්‍ය භාණ්ඩාගාරයේ පැවති වස්තුව පමණක් නොව පස්වන මිහිඳු රජු සිරකරුවකු ලෙස චෝළ දේශයට රැගෙන යාමටද සමත් වේ. මෙම ආක්‍රමණය මෙහෙය වන්නේ චෝළ සෙන්පති දණ්ඩනායක මුවෙන්තමේලර් විසිනි.
- ශ්‍රී ලංකාවේ උතුරු පෙදෙස එතැන් සිට නිශ්චිතවම චෝළ දේශයට යටත් රාජ්‍යයක් බවට පත්වේ.
- එම ප්‍රදේශය 'මුම්මුඩිශෝල මණ්ඩලම්' ලෙසත් අගනුවර වූ පොළොන්නරුව ජනනාථපුරම් හෝ ජනනාථ මණ්ඩලම් නමින්ද නම් කළේය.
- මොහු තම බල ව්‍යාප්තිය සංකේතවත් කරමින් අශ්වමේධ යාගයද පවත්වා ඇත.
- වීරරාජේන්ද්‍ර රජු විසින්ද ලංකාවේ හා මලය අර්ධද්වීපයේ ඇති වූ චෝළ විරෝධී කැරලි මැඩ පවත්වා බල ව්‍යාප්තිය සිදු කර ඇත.
- පළමුවැනි විජයබාහු රාජ්‍ය සමයේදී චෝළ ආධිපත්‍යයෙන් නිදහස් වූ ශ්‍රී ලංකාව එරට සමග මිත්‍ර සබඳතා හෝ විවාහ සබඳතා පැවැත්වීමට උත්සාහ දරා ඇත.
- චෝළ අධිරාජ්‍යයේ පැවැත්මට විශාල ධනයක් අවශ්‍ය වූ නිසා ඉන්දියානු සාගරයේ වෙළඳ ඒකාධිකාරය ලබා ගැනීමට උත්සාහ දරා ඇත.
- ඒ සඳහා නිකොබාර්, ඉස්මුස් ඇතුළු දූපත් යටත් කර ගැනීම.
- පළමු රාජේන්ද්‍ර චෝළ රජු විසින් ශ්‍රී විජය රාජ්‍යට ආක්‍රමණයක් එල්ල කරමින් ශෛලේන්ද්‍ර රජු පරාජයට පත් කොට කඩාරම් (වරාය) බලකොටුව අල්ලා ගැනීම මෙන්ම 'කඩාරම් කොණ්ඩ' යන විරුද නාමය භාවිත කිරීම.
- එම ආක්‍රමණයේ අරමුණ වූයේ චීනය හා අපරදිග රටවල් අතර පැවති වෙළඳාම අත්පත් කර ගැනීමයි.


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- ➢ මීට අමතරව පළමු රාජරාජ විසින් දූපත් දොළොස්දාහ නමින් හැඳින්වෙන මාල දිවයින්ද ජය ගැනීම.
- ➢ පහළ බුරුමයේ රජවරු සමග මිත්‍ර සබඳතා ඇති කර ගැනීමට පළමුවැනි කුලෝත්තුංග රජුට හැකි විය.
- ➢ මලය අර්ධද්වීපයේ ඇතිවූ නිදහස් අරගලය මර්දනයට එහි පාලකයා සමග මිත්‍ර ගිවිසුමක් ඇති කර ගත්තේය.
- ➢ ශ්‍රී විජය රාජ්‍යයේ මාරවිජයෝත්තුංග රජු සමග මිත්‍ර සබඳතා ඇති කර ගැනීම මගින් වක්‍රාකාරව බලය ව්‍යාප්ත කිරීමක් සිදුකර ඇත.

(ලකුණු 16 යි)

9. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) කුෂාණ රාජවංශය.

(ii) ගෞතමීපුත්‍ර සාතකර්ණී.

(iii) දෙවන චන්ද්‍රගුප්ත යටතේ ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය.

(iv) පල්ලව කලා හා ගෘහනිර්මාණ ශිල්පය.

(ලකුණු 8 x 2 = 16 යි.)

(i) කුෂාණ රාජවංශය.

- ➢ මොවුන් චීන තුර්කිස්තානයේ සිට පැමිණි යු-ඒ-චි නම් එඬේර ගෝත්‍රයකට අයත් වේ.
- ➢ වයඹදිග පිහිටි ඛයිබර් කපොල්ල හරහා ඉන්දියාවට ඇතුළුවී වයඹදිග ප්‍රදේශයේ බලය තහවුරු කර ගැනීම.
- ➢ කුෂාණ රාජවංශයේ ප්‍රථම පාලකයා කුජුල කැඩ්පයිසීස් වයඹදිග ඉන්දියාවේ බලය අල්ලා ගැනීම.
- ➢ වීම කැඩ්පයිසීස් තක්ෂිලා හා පංජාබය අත්පත් කරගැනීම පිළිබඳ තොරතුරු තහවුරු වන්නේ කන්දහාර්, කාබුල්, මථුරා ප්‍රදේශවලින් මොහුට අයත් කාසි හමුවීමෙනි.
- ➢ මොහු 'සර්වලෝක ඊශ්වර', 'මහේශ්වර' යන විරුද නාමයන්ගෙන් හඳුන්වා ඇත.
- ➢ පංචාවෝ නමැති චීන සෙන්පතියා සමඟ සටන් කිරීම. සටනින් පරාජයවී චීන ආධිපත්‍යය පිළිගෙන කටයුතු කිරීම.
- ➢ කුෂාණ රාජවංශයේ ශ්‍රේෂ්ඨතම පාලකයා ලෙස කණිෂ්ක රජු හඳුන්වයි. මොහු ගාන්ධාරයේ පුරුෂපුරය අගනුවර කරගෙන පාලනය ගෙන ගොස් තිබේ.
- ➢ මොහු විසින් කාශ්මීරය, රාජ්පුතානා, මාල්වා, උත්තර ප්‍රදේශ්, ශ්‍රාවස්ති, කතියවාර්, ප්‍රදේශ යටත් කර ගත් බව කාසි හා අභිලේඛනවලින් තහවුරු වේ.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- ඇෆ්ගනිස්ථානය හා මධ්‍ය ආසියාවේ යාර්ඛාන්ඩ්, කැෂ්ගාර්, ඛෝටාන් දක්වා බලය ව්‍යාප්ත කරගෙන ඇත.
- බටහිර ඉන්දියාව දෙසටද බලය ව්‍යාප්ත කරගෙන ඇත.
- කණිෂ්ක රජුගෙන් පසු වාශිෂ්ක, හුවිෂ්ක, වාසුදේව යන පාලකයන් බලයට පත්ව ඇත.
- කුෂාණ රාජවංශය විදේශීය රාජවංශයක් වුවද ඉන්දියානු සංස්කෘතියට විශාල අනුග්‍රහයක් දැක්වීම.
- සිව්වන ධර්ම සංගායනාව පැවැත්වීම හා මහායාන බුද්ධමේ දියුණුවට කටයුතු කිරීම.
- මධ්‍යම හා නැගෙනහිර ආසියාතික රටවලට විශේෂයෙන් චීනය, ජපානය, කොරියාව යන රාජ්‍යයන්ට මහායාන ආගම ව්‍යාප්ත කිරීම.
- දියුණු විදේශීය වෙළෙඳාමක් පැවතීම නිසා බුද්ධහමත් ඉන්දියානු සංස්කෘතියත් ඉන්දියාවෙන් ඔබ්බට ගමන් කිරීම.
- යාර්ඛාන්ඩ්, ඛෝටාන් වැනි මධ්‍ය ආසියාවේ ප්‍රදේශවල බෞද්ධ මධ්‍යස්ථාන ආරම්භ කිරීම.
- ඉන්දියානු භාෂා ශාස්ත්‍රීය වර්ධනය ඇතිවීම හා ඒ වෙනුවෙන් අශ්වඝෝෂ, වසුමිත්‍ර, පාර්ශ්ව, නාගර්ජුන, සංඝරක්ෂක යන වියත් භික්ෂූන් වහන්සේ *බුද්ධ චරිතය, සූත්‍රාලංකාරය, ශාරිපුත්‍රප්‍රකරණය, සෞන්දරානන්දය* වැනි විශිෂ්ට කෘති රචනා කිරීම.
- ගාන්ධාරය මුල් කොට ගෙන ග්‍රීක ආභාසයෙන් කලා සම්ප්‍රදායක් බිහි කිරීම - ගාන්ධාර කලාව.
- මථුරා ප්‍රදේශය මුල් කොට ගෙන දේශීය කලා සම්ප්‍රදාය අනුව යමින් මථුරා කලා සම්ප්‍රදාය බිහි කිරීම.
- මානවරූපී විලාසයෙන් බුද්ධ ප්‍රතිමාකරණය ආරම්භ කිරීම.
- බෞද්ධ විහාරාරාම, ස්තූප, ධාතු මන්දිර ඉදිකිරීම.
- සංස්කෘත භාෂාවෙන් ග්‍රන්ථ රචනා කිරීම.

**(ලකුණු 08යි)**

(ii) **ගෞතමීපුත්‍ර සාතකර්ණි.**

- පුරාණ ග්‍රන්ථවල, සාතවාහනයන් ශාතකර්ණි, ශ්වාතකර්ණි, ශාන්තිවර්ණි යන නම්වලින් හඳුන්වා ඇත.
- ග්‍රීක, ශක, පාර්තිය ආක්‍රමණ හමුවේ මඳ කලකට බිඳවැටෙන සාතවාහන බලය නැවත ගොඩනගනු ලබන ප්‍රබල පාලකයා වන්නේ මොහුය.
- ගෞතමී බාලශ්‍රීගේ නාසික් ලිපියෙන් මොහු පිළිබඳ තොරතුරු සොයාගත හැකිය.
- නහපාන නම් ශක ක්ෂත්‍රප රජුට අයත්ව තිබූ අපරාන්ත (උතුරු කොන්කන්), සෞරාෂ්ට්‍ර (කතියවාර්) නැගෙනහිර බටහිර අවන්ති, මාල්වා, කතර් අනූප යන ප්‍රදේශවල බලය අල්ලා ගැනීම.
- ජෛන ආවශ්‍යක සූත්‍රයේ විස්තර වන්නේ රිෂික (ක්‍රිෂ්ණ නදී බඩ), අශ්මක, මූලක (පයිඨාන්) හා විදර්භය ආදී ප්‍රදේශද මොහුගේ ග්‍රහණයට නතු වූ බවයි.
- මොහු රාජරාජ, මහාරාජ, වර - වාරණ - වික්‍රම - චාරු වික්‍රම යන විරුද භාවිත කර තිබේ.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- ඉහළ ඩෙකෑන් ප්‍රදේශය හා බටහිර ඩෙකෑන් ප්‍රදේශයේ බලය අල්ලා ගැනීම.
- නර්මදා නිම්නය, බටහිර රාජස්ථානය, නැගෙනහිර මාල්වා, බටහිර මාල්වා හා උතුරු මහාරාෂ්ට්‍ර ප්‍රදේශවල ආධිපත්‍ය තහවුරු කර ගැනීම.
- බෞද්ධයන්ට මෙන්ම හින්දු පූජකවරුන්ට උපකාර කිරීම.
- කුල භේදය පිළිබඳ නීති දැඩිව ආරක්ෂා කිරීම.
- ක්ෂත්‍රියන්ගේ බලය සම්පූර්ණයෙන්ම මර්දනය කොට බ්‍රාහ්මණයන්ගේ හා අන්‍යකුලවල දියුණුවට ක්‍රියා කිරීම.
- නාසික් ශිලා ලිපියේ දක්වන්නේ රජුගේ අශ්වයන් සමුද්‍ර තුනක ජලය පානය කළ බවයි (තිසමුද - තෝය - පිත - වාහක).

(ලකුණු 08යි)

**(iii) දෙවන චන්ද්‍රගුප්ත යටතේ ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය.**

- දෙවන චන්ද්‍රගුප්ත රජු පිළිබඳව තොරතුරු විමසීමේදී උදාගිරි ප්‍රශස්තිය (උයදගිරි පර්වත ලිපිය) දේවී චන්ද්‍රගුප්තා නාට්‍යය, කුටුබ්මිනාර්, මෙහෙරෞලි, ගොඩවා ලිපිය, මථුරා ටැම්ලිපිය, සාංචි ලේඛන යන මූලාශ්‍රවලින් තොරතුරු ලබා ගත හැකිය.
- ක්‍රි. ව. 386 දී දෙවන චන්ද්‍රගුප්ත බලයට පත්වීම.
- රජුට අයත් විවිධ කාසි මගින් ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය අවබෝධ කර ගත හැකිය.
- විවාහ සම්බන්ධතා මගින් බලය තහවුරු කර ගැනීම.

  උදා: නාග කුමාරිකාවක් වූ කුවේර නාගා විවාහ කරගෙන නාග වංශිකයන් හිතවත් කර ගැනීම, සිය දියණිය වූ ප්‍රභාවති කුමරිය වාකාටක පාලක රුද්‍රසේනට විවාහ කරදීම. එමගින් වාකාටක රජවරුන් හිතවත් කර ගැනීම.

  ප්‍රබල කදම්භ වංශික පාලක කාකුත්ස්ථවර්මන් රජුගේ දියණිය විවාහ කර ගැනීම තුළින් කදම්බ වංශිකයන් හිතවත් කර ගැනීම.

- මාල්වා, ගුජරාට හා සුරාෂ්ට්‍රය පාලනය කළ උජ්ජේනියේ ශක පාලක තුන්වන රුද්‍රසිංහ යටත් කිරීම.
- බෙංගාලයේ වංග පාලන සන්ධානය පරාජය කිරීම.
- සින්දු නදී මුවදොර තරණය කොට වාහ්ලිකවරුන් පරාජය කිරීම.
- බැක්ට්‍රියාව දක්වා ආක්‍රමණයක් එල්ලකර පංජාබයට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල පාලකයන්ගේ අවනතභාවය ලබා ගැනීම.
- බ්‍රහ්මපුත්‍ර නදී තෙර සිට හින්දුකුෂ් දක්වා වූ කලාපයත්, මහාරාෂ්ට්‍රයේ නර්මදා නදී තෙර දක්වා කලාපයත් තුළ සිය ගුප්ත බලය ව්‍යාප්ත කිරීම.
- පාටලීපුත්‍රය හා උජ්ජෙයිනිය පාලන මධ්‍යස්ථාන බවට පත්කොට එක්සත් බව සුරැකීම.
- භාරුකච්ච, කැම්බේ, සොපාරා වරායන් යටත් කර ගැනීම.
- දේශ සීමා ව්‍යාප්ත වීම.
- ෆාහියන් හිමි මේ අවධිය පිළිබඳ විස්තර කර තිබේ.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iv) පල්ලව කලා හා ගෘහනිර්මාණ ශිල්පය.

- පල්ලව රජවරුන් ගොඩනැගූ දේශපාලන බලය හා ආර්ථික වර්ධනය කලාවට සෘජු බලපෑමක් කිරීම.
- පල්ලවයන්ගේ අගනුවර කාංචිපුරය මුල් කොට ගෙන කලාව වර්ධනය වීම.
- දකුණු ඉන්දියානු ගෘහනිර්මාණ ශිල්පයේ ශ්‍රේෂ්ඨ අවධියක් වීම.
- පර්වත හාරා දේවාල සකස් කිරීම.

කුළුණු සහිත ලෙන් දේවාල (මණ්ඩගපට්ටු, ත්‍රිචිනාපොලි, පල්ලාවරම්)

මණ්ඩප හා රථ (මහාබලිපුරම්) මහාභාරතයේ එන වීරවරුන්ගේ නම්වලින් රථ හඳුන්වා තිබීම (භීම, අර්ජුන, සහදේව, ධර්මරාජ, ද්‍රෞපදි, නකුල, ගනේෂ, පීඩාරි, වලයියාන්කුට්ටි).

- කළුගල් භාවිත කර ඉදිකළ දේවාල - මාමල්ලපුරයේ හා කාංචිපුරයේ දක්නට ලැබීම (කෛලාශනාථ දේවාලය, වෛයිකුණ්ඨ පෙරුමාල් දේවාලය).
- රාජ්‍ය අනුග්‍රහය බොහෝ නිර්මාණවලට ලබාදී තිබේ.
- පිහිටි ගලින් නෙළන ලද රථ සප්ත ස්තූප නමින් ප්‍රසිද්ධය. උදා: ධර්මරාජ රථ
- මාරවර්මන් රාජසිංහ ශෛලිය හා නන්දිවර්මන් ශෛලිය අනුගමනය කරමින් මාමල්ලපුරයේ හා කාංචිපුරයේ දේවාල ඉදිකිරීම.
- ගෘහනිර්මාණයේ හා කලාවන්හි විශිෂ්ටතා පෙන්නුම් කරන දේවාල ලෙස වෛකුණ්ඨ පෙරුමාල් හා කෛලාශනාථ දේවාල වැදගත් වීම.
- මෙකල අලංකාර කුඩා දෙවොල් ඉදිකිරීමත් දක්නට ලැබේ.

  උදා: මාතංගේශ්වර, මුක්තේශ්වර, වීරථානේශ්වර, පරාශුරාමේශ්වර, වාඩා මල්ලිශ්වර.
- මූර්ති හා කැටයම් කලාවද පල්ලව යුගයේ වඩාත් ජනප්‍රියවී තිබේ.
- කාංචිපුරම් හා මහාබලිපුරම්හි දේවාලවල ගලින් නෙළන ලද මූර්ති දක්නට ලැබීම.
- හින්දු ආගමික කථා නෙළා තිබීම - විෂ්ණු, කෘෂ්ණ සූර්ය, දුර්ගා, ගජ ලක්ෂ්මි (ත්‍රිමූර්තිය), වරාහ අවතාරය, වාමන අවතාරය මූර්තිමත් කිරීම.
- රජවරුන් මූර්තිමත් කිරීම (මහේන්ද්‍රවර්මන් හා සිංහ විෂ්ණු).
- සත්ව රූප ඉතා සිත්ගන්නා ලෙස නිර්මාණය කිරීම (වෘෂභ රූප, සිංහ රූප.).
- පල්ලව කලා සම්ප්‍රදායේ විශිෂ්ටම නිර්මාණය ලෙසට 'අර්ජුනගේ තපස් රැකීම' නමින්ද පසුව 'ගංගා නදියේ අවරෝහණය' නමින්ද හැඳින්වෙන කලා කෘතිය සැලකිය හැකිය.

**(ලකුණු 08 යි)**

******

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/